# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk e-mail: info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/PE/2024/21 | ඔබේ අංකය : | දිනය : 2024.10.03 |
| எனது இல. : | உமது இல.: | திகதி : |

තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්, ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024**
**මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග**

2024.11.14 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ප්‍රචාරක කටයුතු සීමා කිරීම පිළිබඳ පහත නියමයන් මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

ප්‍රචාරණ විධි හා රැස්වීම්

1. ප්‍රසිද්ධ ස්ථානවල අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වූ දැන්වීම්, ප්‍රචාරක පුවරු, පෝස්ටර්, කටවුට්, ධජ, පතාක, බැනර්, තොරණ්, චිත්‍ර, ඡායාරූප, ඡන්ද ලකුණු/අපේක්ෂක නම්, ආවේනික වැකි ප්‍රදර්ශනය තහනම් කර තිබෙන අතර අපේක්ෂකයන්/ පක්ෂ ප්‍රවර්ධනය වන ටී ෂර්ට් සහ හිස් වැසුම් තහනම් කර තිබේ. කිසිදු අවස්ථාවක ජාතික ධජ, ආගමික ධජ, ආගමික සංකේත ප්‍රදර්ශනය නොකළ යුතු ය

2. මහජනතාවට පීඩාකාරී නොවන ලෙස උපරිම පස් දෙනෙකුගෙන් පමණ සමන්විත පිරිසක් සමඟ ගෙයින් ගෙට ගොස් පමණක් අත් පත්‍රිකා බෙදිය හැකි නමුත් එම පත්‍රිකා ප්‍රදර්ශනය කළ නොහැක. සෑමවිටම එම අත් පත්‍රිකා මුද්‍රණය කරන ලද ප්‍රකාශක ආයතනය, මුද්‍රණාලයේ ලිපිනය යන විස්තර එම පත්‍රිකාවේ මුද්‍රණය කර තැබීම අනිවාර්යය වේ.

3. මැතිවරණයට තරග කරනු ලබන අපේක්ෂකයෙකුට ආධාර වශයෙන් පවත්වන රැස්වීමකදී, එම රැස්වීම පැවැත්වීමට දින හතකට (07) පෙර සිට රැස්වීම පැවැත්වෙන ස්ථානය, දිනය, වේලාව, කථික ලැයිස්තුව හා අපේක්ෂකයන්ගේ නම් ආදී විස්තර පමණක් ඇතුළත් පෝස්ටරයක් අදාළ දිස්ත්‍රික් සීමාවේ පමණක් ප්‍රදර්ශනයට අවසර ඇත.

4. රැස්වීම පැවැත්වෙන දිනයේ දී එම රැස්වීම පැවැත්වෙන ස්ථානයේ පමණක් නීත්‍යානුකූලව පිළියෙල කරනු ලැබූ අත් පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර හා ඡායාරූප ආදිය ප්‍රදර්ශනය කළ හැකි අතර රැස්වීමක් පැවැත්වීමේ දී රැස්වීම් භූමිය පමණක් සැරසීමට ඉඩ ලබා දිය හැක. එසේම එළිමහන් ස්ථානයක් නම් එම වේදිකාව අවට පමණක් සැරසිලි කිරීමට ඉඩ ලබා දෙන අතර, රැස්වීමක් පැවැත්වෙන අවස්ථාවේ දී එම ප්‍රදේශයේ වට රවුම් මංසන්ධිවල කොඩි, බැනර්, ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය නොකළ යුතු ය. එසේම ශබ්ද විකාශන යන්ත්‍ර රැස්වීම් භූමියේ ඇතුළත පමණක් සවිකල යුතු අතර, එහි ශබ්දය රැස්වීම් භූමියෙන් පිටතට උස්කාරණය නොවන ලෙස රැස්වීම් භූමියට පමණක් සීමා කිරීම කළ යුතු ය.

5. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට දන්වන ලද අපේක්ෂකයාගේ වාහනයේ පමණක් අපේක්ෂක ප්‍රචාරක පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙන අතර, අපේක්ෂකයෙකු ගමන් නොකරන වාහනයක මැතිවරණය සම්බන්ධ අත් පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍ර, දැන්වීම් කොළ, චිත්‍ර, අපේක්ෂකයින්ගේ ඡායාරූප, ලකුණු හෝ සලකුණු ප්‍රදර්ශනය කළ නොහැක. අපේක්ෂකයකු ගෙන යාම සඳහා පාවිච්චි කරනු ලබන වාහනයක් තුළ හෝ වාහනයේ පමණක් කොඩියක් හෝ පතාකයක් ප්‍රදර්ශනය කළ හැකි ය. අපේක්ෂකයකු ගෙන යාමට ඉඩ ඇතැයි සළකා විශාල වාහන සංඛ්‍යාවක මෙසේ කොඩි හෝ පතාක ප්‍රදර්ශනය කිරීම වරදකි. එබැවින් අපේක්ෂකයකු ගමන් කරනු ලබන අවස්ථාවක දී එම වාහනයේ පමණක් කොඩියක් ප්‍රදර්ශනය කිරීමට නීතියෙන් ඉඩ තිබෙන බව පිළිගෙන කටයුතු කළ යුතු ය. මහජනයාගේ ගමනාගමනය සඳහා යොදා ඇති දුම්රිය, ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ හෝ පෞද්ගලික බස් රථවල හෝ වෙනත් පෞද්ගලික වාහනවල හෝ මෙවැනි දෑ ප්‍රදර්ශනය කළ නොහැක.

6. ප්‍රචාරක කටයුතුවල දී රිය පෙරහැරවල් පැවැත්වීම සිදුකළ නොහැක. (පවත්නා නීති ප්‍රතිපාදන තුළ රථ වාහන සංඛ්‍යාව නිශ්චිතවම සඳහන් කර නොමැති නමුත් රිය පෙරහැරක් යනු සාමාන්‍ය මහජනතාවට අවහිර වන සේ පක්ෂ/ අපේක්ෂක/ දේශපාලන ප්‍රවර්ධනයක් ඇති කරමින් රථ වාහන පහකට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකක් පසුපස එකක් ගමන් කිරීම ලෙස සැලකිය හැක.


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
*E-mail: chairman@elections.gov.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
*e-mail: cge@elections.gov.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස්
(නීති, විමර්ශන හා සැලසුම්)
மேலதிகத் தேர்தல்கள் ஆணையாளர்
(சட்டம், விசாரணைகள் மற்றும் திட்டமிடல்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868448

නිවේදිත මැතිවරණ කාර්යාලවල ප්‍රචාරණ කටයුතු

1. නිවේදිත මැතිවරණ කාර්යාල පරිශ්‍රයක ඇතුළත සීමාව තුළ පමණක්, කාර්යාලය හැඳින්වෙන නාම පුවරුවක්, පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සළකුණ දැක්වෙන පුවරුවක් සහ අපේක්ෂකයන්ගේ ඡායාරූප සහිත පුවරුවක් ප්‍රදර්ශනය කිරිමට ඉඩ ලබා දෙන අතර මෙම පුවරු සියල්ල වර්ග අඩි 60 නො ඉක්මිය යුතුය. තවද කාර්යාල ඇතුළත භූමියේ කොඩි 06 ක් ප්‍රදර්ශනය කිරිමට අවස්ථාව ඇත. එයට අමතරව වෙනත් කිසිදු සැරසිල්ලක් සිදු කිරිමට ඉඩ ලබා නොදෙන අතර කිසිදු විටක මහා මාර්ගය හරහා මහා මාර්ගය මත, පදික වේදිකාවේ, විදුලි රැහැන් කණුවල පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම්, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. පෙර සඳහන් එකඟතාව මත ලබා දී ඇති අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම්, ප්‍රචාරක පුවරු, ප්‍රදර්ශනය කළ නොහැකිය යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.
2. අදාළ පක්ෂයේ/ කණ්ඩායමේ අපේක්ෂකයකු නොවන වෙනත් කිසිදු දේශපාලනඥයකුගේ හෝ අපේක්ෂකයකුගේ ඡායාරූප, ඡන්ද ලකුණු, ආවේනික වැකි යනා දී කිසිවක් කාර්යාලයක ප්‍රදර්ශනය කළ නොහැකි ය.
3. කිසිදු ඡන්ද කාර්යාලයක ජාතික ධජ, ආගමික ධජ, ආගමික සංකේත ප්‍රදර්ශනය නොකළ යුතු ය.
4. එමෙන්ම, සෑම නිවේදිත මැතිවරණ කාර්යාලයකම ප්‍රදර්ශනය කරන පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය වූ පුවරු, ධජ, පතාක, ඡායාරූප යනාදිය 2024.11.11 වන දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු වේ. එසේ වුවත් මැතිවරණ කොට්ඨාස සඳහා වූ මධ්‍ය කාර්යාලය හා නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලවල එම කාර්යාලය හැඳින්වීම් සඳහා වූ නාම පුවරුව පමණක් ප්‍රදර්ශනය කළ හැක. යම් හෙයකින් එම කාර්යාල ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර 500 ක දුරක් ඇතුළත පිහිටා ඇත්නම් මෙම කාර්යාලයම ඉවත් කළ යුතු ය.
5. අපේක්ෂකයා පදිංචි නිවස නිවේදිත මැතිවරණ කාර්යාලයක් ලෙස පවත්වාගෙන යාමේ දී එම නිවේදිත කාර්යාලය ද මෙහි සඳහන් සීමාවන්ට යටත්ව සැරසිළි සිදුකළ හැක.
6. එසේම නිවේදිත මැතිවරණ කාර්යාල ලෙස භාවිතා කිරිමට අනුමැතිය ලබා ගන්නා ලද තාවකාලික මඩු සඳහා එසේ නිවේදිත මැතිවරණ කාර්යාලයක් ලෙස පවත්වාගෙන යෑමට අනුමැතිය ලබා ගත් දේශපාලන පක්ෂය හෝ අපේක්ෂකයා විසින් පැය 24 පුරාවටම එම තාවකාලික මඩු සඳහා ආරක්ෂාව ලබා දිය හැකි වැඩ සැලැස්මක් සකස් කිරිම අත්‍යාවශ්‍ය වේ ය.
7. කිසිදු නිවේදිත මැතිවරණ කාර්යාලයක දිවයිනේ පොදු නීති හා මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සිදු නොවිය යුතු බව ද අවධාරණය කෙරේ.

අංක 2034/37 දරන 2017.09.01 දිනැති ගැසට් පත්‍රයට අනුව දේශපාලන, සමාජයීය, ආගමික, ජාතික, සංස්කෘතික හෝ වෙනත් යම් උත්සව හෝ අවස්ථා සඳහා සියලුම ආකාරයේ පොලිතින් වර්ග සැරසිලිවලට භාවිතා කිරිම තහනම් කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් පරිදි නීත්‍යානුකූලව පිළියෙල කරනු ලබන අත් පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර හා ඡායාරූප, ධජ, පතාක, ප්‍රචාරක පුවරු හා ආරුක්කු ආදිය ද පොලිතින් භාවිතයෙන් තොරව පිළියෙල කරන ලෙසට දන්වමි. තවද රැස්වීම් පැවැත්වෙන ස්ථානවල සහ නිවේදිත මැතිවරණ කාර්යාලවල සැරසිලි ද සියලුම ආකාරයේ නීත්‍යානුකූල ප්‍රචාරණ කටයුතුවල දී ද පොලිතින් භාවිතා කිරීමට ඉඩ ලබා නොදේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. පොලිස්පති (වැ.බ.)
3. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්
4. සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
5. සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු
6. දිස්ත්‍රික් මැතිවරණ නිරාකරණ මධ්‍යස්ථානවල සියලුම සහකාර තේරීම්භාර නිලධාරීන්

} නියමවලට අනනුකූල ප්‍රචාරක පුවරු ඉවත් කිරීම සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සීමා කිරීම සඳහා